# ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම -
## ලෝකය පෝෂණය කරන කම්කරුවන්ගේ අයිතිවාසිකම් සහ ජීවනෝපාය මාර්ගයන් ආරක්ෂා කිරීම .

අයි.යු.ඇෆ්. ආසියානු/පැසිෆික් කලාප සංවිධානය
2020 ලෝක ආහාර දිනය

වසර 50 ක් තුළ දරුණුතම ගෝලීය ආහාර අර්බුදයට අප මුහුණ දී සිටින බවට 2020 ජූනි මාසයේදී එක්සත් ජාතීන් අනතුරු ඇඟවීය.

COVID-19 වසංගතය සෑම රටකම ආහාර සැපයුමට බලපා ඇති අතර, මිනිසුන් ගමන් කිරීම සීමා කිරීම, ප්‍රවාහනයට හා බෙදා හැරීමට බාධා කිරීම සහ දේශසීමා වසා දැමීම හේතුවෙන් ආහාර හිඟයක් හා මිල ඉහළ යාමක් සිදුවෙයි. නගරවල ආහාර මිල ඉහළ යන විට වසංගතය අවදානමට ලක්විය හැකි ග්‍රාමීය ප්‍රජාවන් දරිද්‍රතාවයට හා ණය බරට ඇද දමයි.

මේ අනුව කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය හා බෙදා හැරීමට බාධා සිදුවීම, කෘෂිකර්මාන්තය සහ බෝග විකිණීම යන දෙකටම COVID-19 වසංගතය බලපාන අතර නගරවල නිෂ්පාදන හිඟතාවයන් ඇති කරයි. අතිරික්ත කෘෂිකාර්මික නිෂ්පාදන විශාල වශයෙන් ඉවත දමා විනාශ කරන අතර මිලියන සංඛ්‍යාත ජනතාවක් කුසගින්නෙන් පෙළෙති. අප කලාපය පුරා අවිධිමත් අංශයේ වීදි වෙළෙන්දන් සහ ගෘහ සේවිකාවන් මිලියන ගණනක් ඔවුන්ගේ ජීවනෝපායන් මේ වනවිටත් අහිමි කර ගෙන ඇත. සෘතුමය හා සංක්‍රමණික කම්කරුවන්ට ඇති ගමන් කිරීමේ සීමාවන් බාධකයන් වශයෙන්ද කෙත්වතු, ගොවිපලවල් සහ වතුකරයේ ශ්‍රම හිඟයක් ඇති කිරීම සඳහාද මෙම තත්වය හේතුවෙයි. කම්කරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට, මෙය ජීවිත වලට තර්ජනාත්මක ලෙස සහ වැටුප් හා ජීවනෝපායන් අහිමි වීම් උග්‍රවන තත්වයකට, වසංගත තත්වයකටත් වඩා විශාල අවදානමකට ඔවුන්ගේ ජීවිත නිරාවරණය කරයි.

උග්‍රවන වසංගතය හේතවෙන් රටවල් වසාදමා ඇති කාලයේදී, ජනගහනය පෝෂණය කිරීම සඳහා ආහාර සැකසීමේ සේවකයින්, මස් සැකසුම් හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්ත සේවකයින් අත්‍යවශ්‍ය කම්කරුවන් ලෙස බොහෝ රටවල් ප්‍රකාශයට පත් කරන ලදී. ඔවුන්ගේ සේවය මෙම කර්මාන්තයට අත්‍යවශ්‍ය සේවකයින් වන නමුත්, ඔවුන් අත්‍යවශ්‍ය සේවකයින් නොවේ. ඔවුන්ගේ පිළිගැනීම සහ සේවා ගෞරවය ප්‍රතික්ෂේප කිරීම, ඔවුන්ගේ දායකත්වය අවතක්සේරු කිරීම මෙන්ම එය නොසලකා හැරීමකි. COVID-19 පැතිරීම සීමා කිරීමට සහ කම්කරුවන් ආරක්ෂා කිරීම සෙමින් සිදුවන අතරතුරක වසංගත කාලයේද බොහෝ සේවා යෝජකයින්, කීර්තියට වන හානිය අවම කිරීම සහ වෙළඳ නාම ප්‍රතිරූපය ආරක්ෂා කිරීමට ඉක්මන් වූ බව දැකිය හැක.

අනාරක්ෂිත රැකියාවන්, සේවකයින්ගේ රැකවරණය අඩපණ කොට ඔවුන්ව ඊටත් වඩා විශාල අවදානමකට නිරාවරණය කළත්, සේවකයින් බාහිරින් ලබා ගැනීම සහ අනියම්කරණය වැඩි වීම දක්නට ලැබුණි. මස් සැකසුම් කර්මාන්තය ලොවට පෙන්වා දුන් පරිදි, කම්කරුවන්ගේ අවදානම ආයතන වලට ලාභදායීවූ අතර කම්කරුවන්ගේ ආරක්ෂාව එසේ නොවීය. ආහාර හා පාන නිෂ්පාදන කර්මාන්තශාලා වල පැතිරීම වැඩිවීමත් සමඟම රටවල් කිහිපයක ආණ්ඩු සහ සේවා යෝජකයන් වෘත්තීය සමිතිවලට පහර දුන් අතර වෘත්තීය සමිති සාමාජිකයන් වීම නිසා කම්කරුවන්ට දඬුවම කිරීමට අවශ්‍ය සෑම අවස්ථාවක්ම ලබා ගත්හ. වෘත්තීය සමිතීන්වලට, ඔවුන්ගේ සාමාජිකයන් ලෝකය පෝෂණය කරමින් සිටියදී, ආරක්ෂිත සේවා ස්ථානයකට ඇති අයිතිය වෙනුවෙන්ද සටන් කිරීමටද සිදුවිය .

වර්ධනය වන මෙම අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ලෝක ආහාර පද්ධතියේ ආධිපත්‍යය දරන ගෝලීය කෘෂි ආහාර සංස්ථා තම ජාත්‍යන්තර වෙළඳාම යථා තත්ත්වයට පත් කර ඔවුන්ගේ ලාභ නැවත ලබා ගැනීමට උත්සාහ කරයි. ඔවුන් යථා තත්වයට පත් කිරීමට උත්සාහ කරන පද්ධතිය ඉහළ වටිනාකම් සහිත වෙළඳ නාම සහ වෙළඳ භාණ්ඩ මිල මත පදනම් වූ එකකි. අඩු ආදායම් සහ ග්‍රාමීය ජනතාවගේ දරිද්‍රතාව, ඉහළ ඵලදායීතාව සහ විෂ සහිත

පළිබෝධනාශක, තිරසාර නොවන කාර්මික කෘෂිකර්මාන්තය සහ පාරිසරික විනාශය පිළිබඳ නිෂ්පාදකයින් සළකා නොබැලේ. එය සෑම වසරකම පළිබෝධ නාශක විෂ මිලියන 3 ක් ඇති කරන අතර එමගින් ජීවිත 250,000 කට වඩා මිය යයි. වසංගතයට පෙර මිලියන 820 ක ජනතාවක් කුසගින්නෙන් පෙළෙන පද්ධතියක් “නිදන්ගත ආහාර අනාරක්ෂිතභාවය” ලෙස හැඳින්විය හැක. කෘෂිකාර්මික කම්කරුවන්, ආන්තික ගොවීන් සහ ඔවුන්ගේ ප්‍රජාවන් මෙම නිදන්ගත ආහාර අනාරක්ෂිතභාවයෙන් පෙළෙන අය අතර වේ. ඔවුන් ලෝකය පෝෂණය කරනමුත් තමන්වම පෝෂණය කිරීමට නොහැකිවී ඇත .

වසංගතයට පෙර ලෝක ආහාර ක්‍රමය අර්බුදයකට ලක්ව තිබුණි. එය ලොව විශාලතම තේ වෙළඳ නාමවලට තේ කෝප්පයක් පොරොන්දු විය හැකි අතර තේ වතු කම්කරුවන්ට ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන මූලික මානව අයිතිය ප්‍රතික්ෂේප කරයි. සුපිරි වෙළඳසැල් කෙසෙල් වල වටිනාකමෙන් අඩකට වඩා වට්ටම් මිලකට ලබා ගන්නා අතර කෙසෙල් වතු කම්කරුවන්ට පළිබෝධනාශකවලින් වස දී වෘත්තීය සමිති සංවිධානය කිරීම වෙනුවෙන් කම්කරුවන්ට අමානුෂික ලෙස දඬුවම් කරයි. ලෝකයේ මුහුදු ආහාර සැපයුම රඳා පවතින්නේ දැවැන්ත ලෙස මසුන් ඇල්ලීම සහ ඕනෑම සාගර ජීවියෙකු විනාශ වීම මත බවත් මානව කුට්ටනය සහ බලහත්කාරයෙන් වැඩ ගැනීමේ කුරිරු පාලන තන්ත්‍රයක් මත විශ්වාසය තබමින්, මුහුදු ආහාර සැකසුම් කර්මාන්තශාලා වල අනාරක්ෂිත බව සහ අනාරක්ෂිත වැඩ පිළිබඳ සේවා යෝජකයා නොසළකා හරියි.

ලෝක ආහාර ක්‍රමය යනු ග්‍රාමීය දරිද්‍රතාවය මත යැපෙන පද්ධතියක් වන අතර ළමුන් මිලියන 98 ක් කුඹුරුවල, ගොවිපලවල හා වතුකරයේ සූරාකෑමට ලක්ව ඇති අතර, කෑලි අනුපාත වැටුප් තන්ත්‍රයන් මත ළමයින්ට තම දෙමව්පියන් සමඟ වැඩ කිරීමට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ පැවැත්ම සඳහා ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමටය. මෙය ජීවත්වීමට වැටුපක් මිස ජීවමාන වැටුපක් නොවේ. මෙය ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය සමඟ පුරුෂාධිපත්‍යය සහ කාන්තාවන්ගේ ආයතනික අවදානම මත ගොඩනැඟුණු පද්ධතියකි. නමුත් එය ප්‍රචණ්ඩකාරී අපරාධයට වඩා ‘සංස්කෘතිය’ ලෙස හැඳින්වේ. බහුතරයක් ලෙස සිදුවන්නේ ලෝකය පෝෂණය කිරීම සඳහා දස ගුණයකින් තම ශක්තිය යොදවන කාන්තාවන් වෙනස් කොට සැලකීම සහ කොන් කිරීමය. මෙය වසංගතයටද පෙර පැහැදිලිව කැඩී ගිය පද්ධතියකි. එය සවි කිරීමට අවශ්‍ය නොවන අතර එය ප්‍රතිස්ථාපනය කළ යුතුය.

ප්‍රතිපත්තිමය උපදෙස්, රජයේ ක්‍රියාකාරී සැලසුම් සහ එන්නත් පිළිබඳ පොරොන්දු යන සියලු අවුල් සහගත තත්වයන් තුළ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP), වර්ෂ 2020 අප්‍රේල් මාසයේදී වාර්තාවක් ප්‍රකාශයට පත් කරමින් මෙම වසංගතය අප විසින් ඇති කළ බව පැහැදිලි කළේය. අප ගොවිතැන් කරන ආකාරය සහ ලෝකය පෝෂණය කරන ආකාරය වෙනස් නොකරන්නේ නම්, ඊළඟ වසංගතය ද අප විසින් නිර්මාණය කරනු ඇති බව එමගින් පෙන්වා දී ඇත.

COVID-19 වලට හේතු වන නවතම කතාව වන කොරෝනා වයිරස් වැනි රෝග මතුවීමට හා පැතිරීමට හේතු වන මානව ක්‍රියා UNEP වාර්තාව මගින් පැහැදිලි කරයි. එහි දේශගුණික විපර්යාස, පාරිසරික විනාශය, කාර්මික කෘෂිකර්මාන්තය, සත්ත්ව ප්‍රෝටීන් සඳහා ඇති ඉල්ලුම සහ අපගේ ආහාර සැපයුම මෙම “රෝග ධාවකයන්ට” ඇතුළත් වේ. වෙනත් වචන වලින් කිවහොත්, ලෝක ආහාර පද්ධතිය මෙම වසංගතය ඇති කිරීමට උපකාරී විය. එහි සියලු නරකම දෘෂ්ටීන්ට අනුව එය “රෝග ධාවකයකි”.

මීළඟ වසංගතය වැළැක්වීම සහ ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම සඳහා අප ලෝක ආහාර පද්ධතිය නැවත ගොඩනැඟීම නොව, අපට අවශ්‍ය පාරිසරික හා සමාජීය තිරසාර ආහාර පද්ධති නිර්මාණය කළ යුතුය.

කාන්තාවන් මුහුණ දෙන පුළුල් ප්‍රචණ්ඩත්වය, අනාරක්ෂිත බව බැහැර කිරීමට, තුරන් කිරීමට තරම් තිරසාර, සාධාරණ හා ඔරොත්තු දෙන පද්ධතියක් අපට අවශ්‍යය.

ආහාර හා පෝෂණය සඳහා නිවිශ්චිය අයිතියෙන් පටන් ගෙන සමාජ ආරක්ෂාව සහ පුළුල් අයිතිවාසිකම් මත පදනම් වූ තිරසාර ආහාර පද්ධති අපට අවශ්‍යය.

අප ජීවත්වන බිඳෙනසුලු ස්වාභාවික පරිසර විද්‍යාව හා දේශගුණය අනුව තිරසාරව පවත්වා ගෙන යාහැකි ආහාර පද්ධති අපට අවශ්‍යය.

ආහාර  පාන සැපයුම් ක්ෂේත්‍රයේ කම්කරුවන්ගේ අයිතිවාසිකම්වලට අප ගරු කළ යුත්තේ ඔවුන්ගේ රැකියා ආරක්ෂා කිරීමෙන් සහ රැකියා ස්ථානයේ ආරක්ෂාව සැලසීමෙනි.

රැකියාවේ ආරක්ෂාව සහතික කිරීම.
රැකියා ස්ථානයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම.
රැකියාවේ සාමූහික කේවල් කිරීමකට ගරු කිරීම.
රැකියාවේදී සාධාරණ වැටුප් ගෙවීම.

ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම සඳහා
ගොවිපලවල්, කෙත්වතු සහ වතුකරයේ ළමා ශ්‍රමය අප විසින් අවසන් කළ යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතුකරයේ බලහත්කාරයෙන් වැඩ ගැනීම අප විසින් අවසන් කළ යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතුකරයේ කාන්තාවන්ට එරෙහි හිංසනය අප විසින් අවසන් කළ යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතු වල හානිකරදායක පළිබෝධනාශක භාවිතය අප විසින් අවසන් කළ යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතුකරයේ පාරිසරික විනාශය අප විසින් අවසන් කළ යුතුය.

ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම සඳහා
ගොවිපලවල්, කෙත්වතු සහ වතු කම්කරුවන්ට ආහාර හා පෝෂණය සඳහා අයිතිය තිබිය යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතු කම්කරුවන්ට ඉඩම් හා නිවාස අයිතිය තිබිය යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතු කම්කරුවන්ට සාධාරණ වැටුප් සඳහා අයිතිය තිබිය යුතුය.
ගොවිපලවල්, කෙත්වතු සහ වතු කම්කරුවන්ට වෘත්තීය සමිතියකට බැඳීමට අයිතිය තිබිය යුතුය.

ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම සඳහා
ධීවර සේවකයින්ට වෘත්තීය සමිතියකට බැඳීමට අයිතිය තිබිය යුතුය.
ධීවර සේවකයින්ට සමාජ ආරක්ෂණ අයිතිය තිබිය යුතුය.
ධීවර සේවකයින්ට සුරක්ෂිතව වැඩ කිරීමේ අයිතිය තිබිය යුතුය.
ධීවර කම්කරුවන්ට ජීවන වැටුපක් සඳහා අයිතිය තිබිය යුතුය.
ධීවර කම්කරුවන්ට තිරසාර ධීවර කර්මාන්තයක් තිබිය යුතුය.

ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම සඳහා
ආන්තික ගොවීන්ට සහ ගොවි කම්කරුවන්ට සමාජ ආරක්ෂාව අවශ්‍යයි.
ආන්තික ගොවීන්ට සහ ගොවි කම්කරුවන්ට ජීවනෝපාය ආරක්ෂාව අවශ්‍ය වේ.
ආන්තික ගොවීන්ට සහ ගොවි කම්කරුවන්ට පාරිසරික ආරක්ෂාව අවශ්‍යයි.
ආන්තික ගොවීන්ට සහ ගොවි කම්කරුවන්ට දේශගුණික බලපෑමවලට එරෙහි ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

ගෝලීය ආහාර අර්බුදය වැළැක්වීම සඳහා අපට අවශ්‍ය අයිතිවාසිකම් පදනම් කරගත් තිරසාර ලෝක ආහාර පද්ධතියක් ගොඩනැගීමට සාමූහික ක්‍රියාමාර්ග ගත යුතුය.